2. 3. 11

නිරාමිස සූත්‍රය

279. මහණෙනි, සාමිස ප්‍රීතියක් ඇත, නිරාමිස ප්‍රීතියක් ඇත, නිරාමිස ප්‍රීතියට වඩා වැඩි වූ නිරාමිසතර ප්‍රීතියක් ඇත. සාමිස සුවයෙක් ඇත, නිරාමිස සුවයෙක් ඇත, නිරාමිස සුවයට වඩා වැඩි වූ නිරාමිසතර සුවයෙක් ඇත, සාමිස උපේක්ෂාවක් ඇත, නිරාමිස උපේක්ෂාවක් ඇත, නිරාමිස උපේක්ෂාවට වඩා වැඩි වූ නිරාමිසතර උපේක්ෂාවක් ඇත. සාමිස විමෝක්ෂයෙක් ඇත, නිරාමිස විමෝක්ෂයෙක් ඇත, නිරාමිස විමෝක්ෂයට වඩා වැඩි වූ නිරාමිසතර විමෝක්ෂයෙක් ඇත.

මහණෙනි, සාමිසප්‍රීතිය කවර යත්: මහණෙනි, මේ කාමගුණ පසෙකි. කවර පසෙක් ද යත්: ඉටු කැමැති මනවඩන ප්‍රියස්වරූප වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු ඇසින් දතයුතු රූපය .. ඉටු කැමති මනවඩන ප්‍රිය ස්වරූප වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු කයින් දතයුතු පහස් ය. මහණෙනි, මොහු පස්කම්ගුණයෝ ය. මහණෙනි, මේ පස්කම්ගුණ නිසා යම් ප්‍රීතියක් උපදී නම් මහණෙනි, මේ සාමිස ප්‍රීතිය යි කියනු ලැබේ.

මහණෙනි, නිරාමිස ප්‍රීතිය කවර යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ කාමයන්ගෙන් වෙන්ව ම අකුශලධර්මයන්ගෙන් වෙන්ව ම විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් උපන් ප්‍රීතිය හා සැපය ඇති ප්‍රථමධ්‍යානයට එළඹ වෙසෙයි. විතර්කවිචාරයන්ගේ සන්හිඳීමෙන් ඇතුළත පැහැදීම ඇති සිතේ එකඟබැව් ඇති විතර්ක රහිත විචාර රහිත සමාධියෙන් උපන් ප්‍රීතිය හා සැපය ඇති ද්විතීයධ්‍යානයට එළඹ වෙසෙයි. මහණෙනි, මේ නිරාමිස ප්‍රීතිය යි කියනු ලැබේ.

මහණෙනි, නිරාමිස ප්‍රීතියට වඩා වැඩි වූ නිරාමිසතර ප්‍රීතිය කවර යත්: මහණෙනි, රාගයෙන් මිදුණු සිත පස්විකන දෙසයෙන් මිදුණු සිත පස්විකන මෝහයෙන් මිදුණු සිත පස්විකන රහත් මහණහට යම් ප්‍රීතියක් උපදී ද, මහණෙනි, මේ නිරාමිස ප්‍රීතියට වඩා වැඩි වූ නිරාමිසතර ප්‍රීතිය යි කියනු ලැබේ.

මහණෙනි, සාමිස සුවය කවරේ ද යත්: මහණෙනි, මේ කම්ගුණ පසෙකි. කවර පසෙක් ද යත්: ඉටු කැමති මනවඩන ප්‍රියස්වරූප වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු ඇසින් දතයුතු රූපය. ... ඉටු කැමති මනවඩන ප්‍රියස්වරූප වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු කයින් දතයුතු පහස ය. මහණෙනි, මොහු පස්කම් ගුණයෝ ය. මහණෙනි, මේ පස්කම්ගුණ නිසා යම් සුවයෙක් සොම්නසෙක් උපදී නම් මහණෙනි, මේ සාමිස සුවය යි කියනු ලැබේ.

මහණෙනි, නිරාමිස සුවය කවරේ ද යත්: මහණෙනි, මෙ සස්නෙහි මහණ කාමයන්ගෙන් වෙන්ව මැ අකුසල්දහමින් වෙන් ව මැ විතර්ක සහිත විචාර සහිත විවේකයෙන් හටගත් ප්‍රීතිය හා සුවය ඇති පළමුවන දෑහැනට එළඹ වෙසෙයි. විතර්ක විචාරයන්ගේ සන්-හිඳීමෙන් ඇතුළත පැහැදීම ඇති සිතේ එකඟබැව් ඇති විතර්ක රහිත විචාර රහිත සමාධියෙන් හටගත් ප්‍රීතිය හා සුවය ඇති දෙවන දෑහැනට එළඹ වෙසෙයි. ප්‍රීතියත් දුරු කිරීමෙන් උපේක්ෂා ඇත්තේත් වෙසෙයි. සිහි ඇත්තේ මනා දැනුම් ඇත්තේ කයින් සුවත් විඳියි. උපේක්ෂා ඇත්තේ ය. සිහි ඇත්තේ ය. සුවවිහරණ ඇත්තේ ය යි. ආර්‍යයෝ ඒ යමකට කියත් නම් ඒ තෙවන දෑහැනට එළඹ වෙසෙයි. මහණෙනි, මේ නිරාමිස සුවය යි කියනු ලැබේ.

මහණෙනි, නිරාමිස සුවයට වඩා වැඩි වූ නිරාමිසතර සුවය කවරේ ද යත්: මහණෙනි, රාගයෙන් මිදුණු සිත පස්විකන දෙස-යෙන් මිදුණු සිත පස්විකන මෝහයෙන් මිදුණු සිත පස්විකන රහත් මහණහුට යම් සුවයෙක් සොම්නසෙක් උපදී නම් මහණෙනි, මෙය නිරාමිස සුවයට වඩා වැඩි වූ නිරාමිසතර සුවය යි කියනු ලැබේ.

මහණෙනි, සාමිස උපේක්ෂාව කවර ද යත්: මහණෙනි, මේ කම්ගුණ පසෙකි. කවර පසෙක් ද යත්: ඉටු කැමති මනවඩන ප්‍රියස්වරූප වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු ඇසින් දතයුතු රූපය ... ඉටු කැමති මනවඩන ප්‍රියස්වරූප වූ කාමයෙන් යුත් ඇලුම් කටයුතු කයින් දතයුතු පහස ය. මහණෙනි, මොහු පස්කම්ගුණයෝ ය. මහණෙනි, මේ පස්කම්ගුණ නිසා යම් උපේක්ෂාවක් උපදී නම් මහණෙනි, මෙය සාමිස උපේක්ෂා ය යි කියනු ලැබේ.

මහණෙනි, නිරාමිස උපේක්ෂාව කවර යත්: මහණෙනි, මෙසස්නෙහි මහණ සුවයත් පැහීමෙන් දුකත් පැහීමෙන් පළමු මැ සොම්නස් දෙම්නසුන් ගේ අභාවයෙන් නොදුක් වූ නොසුව වූ උපේක්ෂාවෙන් හා සිහියෙන් හටගත් පිරිසිදු බැව් ඇති සිවුවන දැහැනට එළඹ වෙසෙයි. මහණෙනි, මේ නිරාමිස උපේක්ෂාව ය යි කියනු ලැබේ.

මහණෙනි, නිරාමිස උපේක්ෂාවට වඩා වැඩි වූ නිරාමිසතර උපේක්ෂාව කවර යත්: මහණෙනි, රාගයෙන් මිදුණු සිත පස්විකන දෙසයෙන් මිදුණු සිත පස්විකන මෝහයෙන් මිදුණු සිත පස්විකන රහත් මහණහට යම් උපේක්ෂාවක් උපදී ද, මහණෙනි, මේ නිරාමිස උපේක්ෂාවට වැඩි වූ නිරාමිසතර උපේක්ෂාව ය යි කියනු ලැබේ.

මහණෙනි, සාමිස විමොක්ෂය කවරේ ද යත්: රූපයෙන් යුත් විමොක්ෂය සාමිස විමොක්ෂ යි. මහණෙනි, නිරාමිස විමොක්ෂය කවරේ ද යත්: අරූපයෙන් යුත් විමොක්ෂය නිරාමිස විමොක්ෂ යි. මහණෙනි, නිරාමිස විමොක්ෂයට වඩා වැඩි වූ නිරාමිසතර විමොක්ෂය කවරේ ද යත්: මහණෙනි, රාගයෙන් මිදුණු සිත පස්විකන දෙසයෙන් මිදුණු සිත පස්විකන මෝහයෙන් මිදුණු සිත පස්විකන රහත් මහණහට යම් විමොක්ෂයෙක් උපදී ද, මහණෙනි, මේ නිරාමිස විමොක්ෂයට වඩා වැඩි වූ නිරාමිසතර විමොක්ෂ යි කියනු ලැබේ.

තෙවැනි වූ අට්ඨසතපරියායවර්ග යි.